**ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 03 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 10 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී . මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී .

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

------------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ අග්‍රිම අවශ්‍යතා ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 533 ක අග්‍රිම ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් සැලැසුම් කළ අග්‍රිම ඇස්තමේන්තුව ඉක්මවා රු.මිලියන 72.44 ක් අග්‍රිම ඉල්ලුම් කර තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියට අග්‍රිම ඉල්ලුම් කිරීම නිවැරදිව සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | දෙපාර්තමේන්තු කාර්යභාර්ය ඉටු කිරීම සඳහා සලසා ඇති ප්‍රතිපාදන උපයෝජනය කළ හැකි පරිදි අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ප්‍රතිපාදන නිෂ්ඵල වීම** | | |
| පුනරාවර්තන වැය විෂයයන් 02 කට හා මූලධන වැය විෂයකට සලසා තිබුණු එකතුව රු.2,050,000 ක ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් 2021.08.21 දිනැති අංක 21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම්ගේ ලිපිය අනුව එම සම්පූර්ණ මුදලම ඉතිරි කිරීමට සැලසුම් කරන ලදි.<br><br>භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු සඳහා වැටුප් සැකසීමේ නව පරිගණක මෘදුකාංග (E-payroll) පද්ධතිය සැකසීමමේ අවසන් ගෙවීමට අදාළ වවුචර් පත් 2021.12.31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදි හා තාත්ත්වික වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

(ආ) **අධි ප්‍රතිපාදන සලසා ගැනීම**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදි පුනරාවර්තන වැය විෂයයන් 04 කට හා මූලධන වැය විෂයයන් 02 කට එකතුව රු.476,952,400 ක අධිප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එකතුව රු.251,827,185 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.225,125,215 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන්ට සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | ප්‍රවාහන දීමනා හිමිකම් ඇති තනතුරක් පුරප්පාඩු වීම, 2021.08.21 දිනැති අංක 21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ ලිපිය අනුව ප්‍රතිපාදන අවුරා තැබීම හා ITMIS ව්‍යාපෘතිය යටතේ පෞද්ගලික සමාගමක් වෙත අනුමත කාර්යන් හා ඇස්තමේන්තු වෙනස් කිරීම යන හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | මු.රෙ.50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වීම. |

(ඇ) **භෞතික වත්කම් ඉදි කිරීම හෝ මිලදී ගැනීම**

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්ගේ මුදල් වැය කිරීම් ලෙස භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.2,855,549 ක වටිනාකමක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා එම වටිනාකම රු.2,215,749 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.639,800 කින් වැඩියෙන් දක්වා තිබුණි. | හැකියා වර්ධනය සඳහා රු. 639,800/- ක් වූ වියදම් ප්‍රාග්ධන වැය විෂයක් යටතේ වෙන් වූ මුදලක් බැවින් එම වියදම් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ "භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්" යටතේ ගිණුම්ගත කර ඇත. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ හෝ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් අත්පත් කර ගැනීම ලෙස සඳහන් වන වියදම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කළ යුතු වීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂයට අදාළ එකතුව රු.1,108,133 ක වියදම් 2022 වර්ෂයේදී සිදුකර තිබුණි. එම වියදම 2021 වර්ෂයේ බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2021 වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවලට අදාළ දූරකථන බිල්පත්, 1/3 දීමනා හා වැඩ බැලීමේ දීමනා ගණනය කිරීමට අදාළ බිල්පත් හා දීමනා ගණන කිරීම් 2022 වර්ෂයේ ලැබී තිබුණු බැවින්, ඒවා 2022 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවා ඇත. | සමාලෝචිත වර්ෂයට අදාළ බැරකම් විධිමත් පරිදි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වීම. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

--------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 06 ඡේදය | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී මුදල් හා හරස් සටහන් යන දෙකම සැලකිල්ලට ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුව තිබුණි. එයට පටහැනිව මුදල් ප්‍රවාහයේ අත්තිකාරම් ලැබීම් හා අත්තිකාරම් ගෙවීම් වල වටිනාකම රු.1,589,195 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගනිමි. ඉදිරියට නිවැරදිව සිදු කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | මුදල් රෙගුලාසි 880 | ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැන්පත් තබා නොතිබුණි. | ඇප තැන්පත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තුවල වැටුප් ගෙවීම් පද්ධතිය පුළුල් කිරීමේ අරමුණින් නව ඊ වැටුප් පද්ධතිය හඳුන්වා දී තිබුණු අතර, දෙපාර්තමේන්තු තුළ පද්ධතිය සජීවි ධාවන තත්ත්වයට පත්කර එම අරමුණු 2022 මැයි 12 දින වන විටත් ළඟා කරගෙන නොතිබුණි. | මෙහෙයුම් ප්‍රතිග්‍රහණ වාර්තාව පිළියෙළ කර අවසන් කර ඇති අතර ඒ සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිර්දේශය ලද වහාම තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ පද්ධති සංවර්ධන ආයතනය යන දෙපාර්ශවය අතර එම ප්‍රතිග්‍රහණ වාර්තාව අත්සන් කිරීමට කටයුතු යොදා ඇත.<br>මීට අමතරව සජීවි ධාවනය සඳහා අත්‍යාවශ්‍ය කරුණක් වන පද්ධතියේ අරක්ෂාව හා තත්ත්ව පරීක්ෂාව (Security Audit and Vulnerability Assessment) සිදු කිරිම සඳහා SLCERT ආයතනයේ පරීක්ෂණ වාර්තාව ඉදිරි සතිය තුළ ලැබීමට නියමිත අතර රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් කරන ලද නිර්දේශයද ලද වහාම සජීව ධාවනය ආරම්භ කිරීමට හැකි වනු ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | රජයේ නිලධාරීන්ට තීරු බදු රහිතව වාහන ආනයනය කිරීමේ අයදුම්පත් මාර්ගගතව යොමු කිරීමේ පද්ධතියේ නව සංවර්ධනයක් සිදුකර, පද්ධතියේ සමස්ථ පරීක්ෂාවක් කර අවසානයේ මුල් අදියර වශයෙන් මුදල් අමාත්‍යාංශය තුළ පවතින දෙපාර්තමේන්තු කිහිපයක පද්ධතිය ධාවනය කිරීමට අපේක්ෂිත බව විගණනය වෙත දන්වා තිබුණද, එය 2022 මැයි 12 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා අප දෙපාර්තමේන්තුව අතර පැවති තාක්ෂණික සාකච්ඡා වලදී මෙම වාහන බලපත්‍ර නිකුත් කිරීමේ සම්පූර්ණ ක්‍රියාවලියම මාර්ගගතව සිදු කිරීමටත් ඒ අනුව එහිදී ඉදිරිපත් කරන තොරතුරුවල නිවැරදි හා වලංගුතාව හැකිතාක් දුරට ස්වයංක්‍රීයව පරික්ෂා කිරීමටත් හැකි වන පරිදි පද්ධතිය වැඩි දියුණු විය යුතු බව තීරණය විය.<br><br>මේ වන විට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ නිලධාරින් විසින් අනුවාහජ දත්ත (Dummy Data) යොදා ගෙන දැනට සංවර්ධිත පද්ධතිය | පද්ධතියට අයත් අනෙකුත් මොඩලයන් ද සංවර්ධනය කර අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | ක්‍රියාත්මක කිරීම හා පරික්ෂා කිරීම සිදු කර ඇත. අනෙකුත් මොඩියුලද සංවර්ධනය කිරීමෙන් අනතුරුව අමාත්‍යාංශය තුළ දෙපාර්තමේන්තු කිහිපයක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට නියමිතය. | |
| (ඇ) | මුදල් අමාත්‍යාංශයේ ප්‍රවාහන ඒකකයේ තොරතුරු පද්ධතිය සංවර්ධනය සඳහා ස්ථාපිත පද්ධති සංවර්ධන ක්‍රියාවලිය ක්‍රියාත්මක තත්ත්වයේ තිබුණද, 2022 මැයි මාසය වන විටත් එම පද්ධතිය භාවිතා කර නොතිබුණි. | ප්‍රවාහන ඒකකයේ ඉල්ලීම පරිදි අදාළ තොරතුරු පද්ධතිය සංවර්ධනය කර ස්ථාපනය කර ඇත. ඒ අනුව දැනට මෙම පද්ධතිය ධාවනය කළ හැකි තත්ත්වයේ පවතින නමුත් ප්‍රවාහන ඒකකය විසින් මෙම තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කිරීම සම්පූර්ණ කළ යුතුව ඇත. | ප්‍රවාහන ඒකකය විසින් අවශ්‍ය තොරතුරු පද්ධතියට එක්රැස් කිරීමට කටයුතු කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ අනුමත වූ තනතුරු 58 කින් තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු තනතුරු තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක් පැවතුණි. | 2022.05.23 දින සිට අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ) පුරප්පාඩුව සම්පූර්ණ කර ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්ය ඉටු කිරීමට අවශ්‍ය කාර්ය මණ්ඩලය ලබා ගැනීම කටයුතු කළ යුතු අතර, අත්‍යවශ්‍ය නොවන සේවක සංඛ්‍යාව විධිමත්ව සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය) තනතුර සඳහා 2021 ජනවාරි 12 දින සිට 2022 ජනවාරි 11 දින දක්වා වැඩබැලීමේ පත්කිරීමක් සිදුකර තිබුණු අතර, ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව අදාළ කාලය නිමාවන තෙක් එම තනතුරු සඳහා ස්ථිර පදනමින් නිලධාරියෙකු පත්කර නොතිබුණි. 2022 ජනවාරි 12 දිනෙන් පසුව වැඩබැලීමේ පත්වීම සඳහා රාජ්‍ය සේවා | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා පත් කළ කාලය දීර්ඝ කිරීම සඳහා මගේ අංක ITM/01/02/01/003 හා 2021.02.06 දිනැති සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MF1/0/03/SLAcS/DTIM හා 2021.12.08 දිනැති ලිපිවලින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා රාජ්‍ය සේවා,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | කොමිෂන් සභාවේ අනුමැතිය 2022 මැයි 12 දින වන විටත් ලැබී නොතිබුණි. | වෙත දැනුම් දී ඇත. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අපේක්ෂා කරනු ලැබේ. | |
| (ඇ) | සේවා අවශ්‍යතාවය මත අමාත්‍ය මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව, දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා නිලධාරියෙකු පත්කර තිබුණි. 2022 මැයි 12 දින වන විටත් ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොතිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රධානි තනතුර සඳහා පත් කිරීමේ බලධාරියා අමාත්‍ය මණ්ඩලය වන බැවින් අමාත්‍යාංශය විසින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වීම. |